ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනපති උපාධි වැඩසටහන -2023/2024

අවසාන පරීක්ෂණය

**STP 9632 - අධ්‍යාපනයේ පරිගණක තාක්ෂණය**

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.08.21 වේලාව : පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**
**විවිධ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී එකම පාඩමක් උදාහරණ ලෙස දැක්වීමෙන් වළකින්න.**

01. "සමාජ කුසලතා හෝ අන්තර් පුද්ගල කුසලතා යනු ඵලදායී සවන්දීම සහ සන්නිවේදනය තුළින් පුද්ගලයින් සමඟ අන්තර් ක්‍රියා කිරීමේ හැකියාවයි."

(i.) කනිෂ්ඨ ද්විතියික සිසුන්ගේ සමාජ කුසලතා සංවර්ධනය කිරීම සඳහා පරිගණක තාක්ෂණය යොදා ගත හැකි ආකාරය උදාහරණ **තුනක් (03)** මඟින් පැහැදිලි කරන්න.
(ලකුණු 30)

(ii.) සිසුන් අතර සමාජ අන්තර්ක්‍රියා සඳහා පරිගණක තාක්ෂණය භාවිතා කිරීමේ වාසි **තුනක් (03)** සහ අවාසි **තුනක් (03)** විස්තර කරන්න.
(ලකුණු 30)

(iii.) Karen Mossberger විසින් නිර්වචනය කර ඇති අයුරින්, ඩිජිටල් පුරවැසියන් (digital citizens) යනු "නිතිපතා සහ ඵලදායී ලෙස අන්තර්ජාලය භාවිතා කරන්නන්" වේ. නිදසුන් **දෙකක් (02)** සපයමින්, පරිගණක තාක්ෂණයේ සුරක්ෂිතභාවය සහ සදාචාරාත්මක භාවිතය සහතික කරමින් කනිෂ්ඨ ද්විතියික සිසුන් අතර, ඩිජිටල් පුරවැසි සංකල්පය ප්‍රවර්ධනය කිරීමේදී ගුරුවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න.
(ලකුණු 40)

02. "විවිධ අධ්‍යාපනික යෙදවුම් (educational applications) සහ ඩිජිටල් වේදිකා (digital platforms) වැනි අන්තර්ක්‍රියාකාරී ඩිජිටල් මෙවලම්, ඩිජිටල් යුගයේ සිසුන්ගේ විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලීන්ට ඒකාබද්ධ කළ හැකිය."

(i.) එවැනි ඩිජිටල් ඉගෙනුම් පරිසරයක (digital learning environment) ලක්ෂණ තුනක් **(03)** සහ ඒවා විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලන ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 30)

(ii.) "ඉගෙනීම සඳහා නිර්මාණාත්මකවාදී ප්‍රවේශයක් (constructivist approach) තාක්ෂණය හෙබි ඉගෙනුම් පරිසරයකට හොඳින් සහාය වේ." සුදුසු උදාහරණ තුනක් **(03)** සමඟ මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 30)

(iii.) සාම්ප්‍රදායික ඉගෙනුම් - ඉගැන්වීම් පරිසරයට සාපේක්ෂව නිර්මාණාත්මකවාදී ඉගෙනුම් පරිසරයක් තුළ ගුරුවරුන්ගේ සහ ඉගෙනුම් ලබන්නන්ගේ භූමිකාවන්හි සිදුවිය යුතු වෙනස්කම් සාකච්ඡා කරන්න. (ලකුණු 40)

03. "ගුරුවරුන් ඵලදායී, කාර්යක්ෂම සහ ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීම්වල නිර්මාණකරුවන් ලෙස ක්‍රියා කරයි."

(i.) තෝරාගත් පාඩමක් සඳහා ඵලදායී, කාර්යක්ෂම සහ ක්‍රියාකාරී ඉගෙනුම් අත්දැකීමක් නිර්මාණය කිරීමට ඔබ සැලසුම් අංග (design aspects) හතර **(04)** සලකා බලන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 40)

(ii.) (i.) කොටසේ විස්තර කර ඇති ඉගෙනුම් අත්දැකීමේ ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම සඳහා ඔබ නොමිලේ සපයා ගත හැකි ඩිජිටල් මෙවලම් භාවිතා කර ඇති ආකාරය උදාහරණ තුනක් **(03)** සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 30)

(iii.) (i.) කොටසේ විස්තර කර ඇති පාඩම සඳහා තාක්ෂණය හෙබි ඉගෙනුම් ද්‍රව්‍ය (TEL) නිර්මාණය කිරීමට ඔබට සහාය වූ ක්‍රමානුකූල උපදේශන සැලසුම් ආකෘතියක (instructional design model) භූමිකාව පරීක්ෂා කරන්න. (ලකුණු 30)

04. "අර්තාන්විත පෙළගැස්වීම (constructive alignment) යනු ඉගැන්වීමේ සැලසුමක් වන අතර, එහිදී සිසුන් ඉගෙන ගත යුතු දේ සහ ඔවුන් ඉගෙනීම ප්‍රකාශ කළ යුතු ආකාරය, ඉගැන්වීම සිදු වීමට පෙර පැහැදිලිව දක්වා ඇත." (Biggs, 2014)

(i.) තෝරාගත් පාඩමක් සඳහා ඔබේ සිසුන් සමඟ ක්‍රියාත්මක කරන ලද තාක්ෂණය හෙබි ඉගෙනුම් අත්දැකීමක් (technology enhanced learning experience) ඇසුරින් උදාහරණයක් සපයමින් "අර්තාන්විත පෙළගැස්වීම" විස්තර කරන්න. (ලකුණු 40)

(ii.) ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීමේදී මෙවලමක් ලෙස 'සංකල්ප සිතියම්කරණය' (concept mapping) උපකාර වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 30)

(iii.) ඉගෙනුම් අත්දැකීම් සැලසුම් කිරීමේදී උපදේශනයේ පළමු මූලධර්ම (First Principles of Instruction) (Merrill, 2012) භාවිතය උදාහරණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 30)

05. විවෘත අධ්‍යාපනික සම්පත් (OER), පිරිවැය නොදැරිය හැකි බව සහ අධ්‍යාපනයට ප්‍රවේශවීමේ බාධක බිඳ දමමින් සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කරන බව පෙන්වා දී ඇත.

(i.) Creative Commons බලපත්‍ර වර්ග සුදුසු පරිදි උපුටා දක්වමින් OER හි 5Rs රාමුව පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) OER සංකල්පය මඟින් අධ්‍යාපනයේ විවෘතභාවය සහතික වන ආකාරය උදාහරණ දෙකක් **(02)** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 40)

(iii.) ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී, OER භාවිතා කිරීමේදි ඔබ මුහුණ දුන් ප්‍රායෝගික දුෂ්කරතා තුනක් **(03)** පැහැදිලි කර, ඒවා අවම කිරීම සඳහා ඔබ විසින් අනුගමනය කරන ලද උපාය මාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 30)

06. ඇගයීම යනු "වැඩසටහන්, නිෂ්පාදන, ක්‍රියා පටිපාටි හෝ වස්තූන් වැනි අංශයන්හි වටිනාකම නිර්ණය කිරීම සඳහා වූ සංයත පරීක්ෂණයකි." (Kifer, 1997 )

(i.) තාක්ෂණය හෙබි අධ්‍යාපනික වැඩසටහනක් සඳහා වූ ඇගයීම් සැලසුමක සාමාන්‍යයෙන් ඇතුළත් කළ යුතු අංශ පහ **(05)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 30)

(ii.) තාක්ෂණ සමෝධානිත මැදිහත්වීමක සඵලතාවය සොයා බැලීමේ ඇගයීම් ක්‍රියාවලියේ අංගයක් ලෙස ප්‍රත්‍යවේක්ෂණ ජර්නලයක් භාවිතා කිරීමේ වාසි තුනක් **(03)** විස්තර කරන්න. (ලකුණු 30)

(iii.) Micro-Credential යනු ඉගෙනුම ලබන්නෙකු කුඩා ඉගෙනුම් පරිමාවකින් පසු ලබාගත් ඉගෙනුම් ප්‍රතිඵල පිළිබඳ වාර්තාවයි. Micro-Credentials සාම්ප්‍රදායික උපාධි සහ සහතිකවලට වඩා වෙනස් වන්නේ ඒවා සාමාන්‍යයෙන් කෙටි හෝ වැඩි නම්‍යශීලී කාල පරාසයන් තුළ පිරිනමනු ලබන අතර, වඩාත් සීමාකාරී අවශ්‍යතා කෙරෙහි නැඹුරු වීමයි.

අ.පො.ස. (උ/පෙළ) තාක්ෂණ විෂය ධාරාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළව සිසුන්ගේ හඳුනාගත් නිශ්චිත කුසලතා සංවර්ධනය ඇගයීම සඳහා එවැනි පරිචයක් අන්තර්ගත කිරීමේ හැකියාව ගවේෂණය කරන්න. (ලකුණු 40)

\- හිමිකම් ඇවිරිණි. -